දුරකථනය / தொலைபேசி / Telephone 2449959
ලේකම් / செயலாளர் / Secretary
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447
E-Mail: secretary@moj.gov.lk
ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785
Web Site: www.moj.gov.lk

# අධිකරණ අමාත්‍යාංශය
# நீதி அமைச்சு
# MINISTRY OF JUSTICE

ටෙලිමේල් / Tele / ரெலிமெயில் — අධිකරණ ලේකම් / நீதிச்செயலாளர் / Secminjust
තැ.පෙ. / தபால்பெட்டி / P.O. Box. 555
ඉලෙක්ට්‍රොනික තැපැල / மின்அஞ்சல் / E-mail info@moj.gov.
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12
மீயுயர் நீதிமன்ற கட்டிடத்தொகுதி
கொழும்பு 12
Superior Courts Complex,
Colombo 12.

මගේ අංකය / எனது இல / My No. MOJ/REF/E15/විවිධ
ඔබේ අංකය / உமது. இல. / Your No.
දිනය / திகதி / Date 2021.07.16

අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ : 03/2021

සියලුම හදිසි මරණ පරීක්ෂකවරුන් වෙත,

<u>කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ හදිසි මරණ පරීක්ෂණ පැවැත්වීම.</u>

කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ හදිසි මරණ පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කොට ඇති අංක DGHS/COVID -19/347/2021 හා 2021.06.23 දිනැති ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.(ඇමුණුම 01)

02. ඉහත ලිපියේ සඳහන් උපදෙස් සියලුම හදිසි මරණ පරීක්ෂකවරුන් විසින් තරයේ පිළිපැදිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

03. මෙම උපදෙස් වලට අනුගත නොවන හදිසි මරණ පරීක්ෂකවරුන් සම්බන්ධ පැමිණිලි සම්බන්ධයෙන් දැඩි විනය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බව අවධාරණය කරමි.

එම්.එම්.පී.කේ.මායාදුන්නෙ
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය

දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம்
website

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

DGHS/COVID-19/347/2021

25 06.2021

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

**<u>කොවිඩ් 19 වසංගතය අතරතුර සිදුවන දෛනික මරණ කළමනාකරණය</u>**

2021.06.18 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී පැවති කොවිඩ් මර්දන කාර්ය සාධක බලකා රැස්වීමේදී නිවෙස්වල සිදුවන මරණ ඥාතීන්ට මුදා හැරීමේදී සිදු වන ප්‍රමාදයන් සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා විය. එහිදී අවධාරණය වූ මූලික කරුණු වූයේ නිවෙස් තුල සිදුවන සියළුම මරණ PCR පරීක්ෂණයන්ට ලක් කිරීම නිසා එම මෘත දේහ ඥාතීන්ට නිදහස් කිරීම ප්‍රමාද වන බවයි. එම තත්වය අවම කර ගැනීම සඳහා පහත සඳහන් පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 17.11.2020 දිනැති අංක DGHS/COVID-19/347/2020 දරණ මාර්ගෝපදේශ මාලාවේ අංක 1. ඡේදය පහත පරිදි සංශෝධනය වේ. (අදාල චක්‍රලේඛය මේ සමඟ අමුණා ඇත.)

කොවිඩ් 19 වසංගතය අතරතුර සිදුවන මරණ සමහරක් කොවිඩ් 19 වෛරසය ආසාදනය වීම නිසා සිදු වුවද, බහුතරයක් මරණ කොවිඩ් 19 වෛරසය ආසාදනය වීම නිසා නොවන බව සංඛ්‍යාලේඛණවලින් තහවුරු වී ඇත.

කොවිඩ් 19 වසංගතය ආරම්භයේ සිට මේ දක්වා නිවෙස් වල මිය යන පුද්ගලයන්ගේ මෘත දේහ ඥාතීන් වෙත නිදහස් කිරීම ග්‍රාම නිලධාරි වරුන් විසින් සිදු නොකරන ලදී. කෙසේවෙතත්, මින් පසු පෙර පරිදි එම මෘත දේහ ග්‍රාම නිලධාරි වරුන්ට සහ හදිසි මරණ පරීක්ෂක වරුන්ට පහත නිර්ණායකයන්ට යටත්ව ඥාතීන් වෙත නිදහස් කළ හැකිය.

අධිකරණ වෛද්‍ය නිලධාරි කාර්යාලයන් වෙත යොමු කෙරෙන මෘත දේහ වලට අදාළ පී.සී.ආර්. (P.C.R) පරීක්ෂණ සිදුකරනු ලබන්නේ අදාල අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ අභිමතය පරිදි වේ. එම මෘත දේහ වල පී සී ආර් පරීක්ෂණ සිදු කළ ද, නොකළ ද හදිසි මරණ පරීක්ෂණයකට යොමු වන්නේ නම්, හදිසි මරණ පරීක්ෂාවක් වරයා හට පශ්චාත් මරණ පරීක්ෂණයකින් තොරව මෘත දේහය ඥාතීන්ට නිදහස් කිරීමට හැකියාවක් ඇත.



385,සුවසිරිපාය, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385,வணக்கத்துக்குரியபத்தேகமவிமலவங்சதேரோமாவத்தை,கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

රෝහල තුල සිදුවන කොවිඩ් මරණ වලට අදාලව මරණය සිදු වූ ආකාරය ස්වභාවික නම් සහ මරණ පරීක්ෂණයක් අවශ්‍ය නොමැති නම්, එම මෘත දේහයට අදාළ මරණ ප්‍රකාශය (**Declaration of death / B 33 form**) වාට්ටුවේ වෛද්‍ය නිලධාරී විසින් නිකුත් කරනු ඇත.

කෙසේ වෙතත්, අදාළ පී.සී.ආර් (**P.C.R**) පරීක්ෂණය ධනාත්මක (පොසිටිවු) වන්නේ නම්, එම මෘත දේහයට අදාළ මරණයට හේතුව අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් නිර්ණය කළයුතුය. එබැවින් පී.සී.ආර් ධනාත්මක මෘතදේහ සියල්ලක්ම මරණ පරීක්ෂණයේදී පශ්චාත් මරණ පරීක්ෂණයක් සඳහා යොමු කල යුතුය. මෙයට හේතුව වන්නේ කොවිඩ් වෛරසය ආසාදනය වූ මෘත දේහ වල මරණයට හේතුව විද්‍යානුකූල ව සඳහන් කළයුතු වීම සහ එය සෞඛ්‍ය අමාත්‍යංශය වෙත නිසි ක්‍රියාවලිය යටතේ දැනුම් දීම (**Notification**) ක්‍රමවත් ව සිදු විය යුතු බැවිනි.

රෝහල් වලට ඇතුලත් කිරීමේදී මිය යන හා නේවාසිකව සිටියදී මිය යන පුද්ගලයන්ගේ මෘත දේහයන් වල පී.සී.ආර් සාම්පල ලබා ගැනීම සම්බන්ධයෙන් මා විසින් දැනටමත් වෛද්‍යවරුන් හා රෝහල් බලධාරීන් දැනුවත් කර ඇත. මෙයට අමතරව, නිවෙස් වල සිදු වන මරණ සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වරුන්/ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් ලබා දෙන නිෂ්කාෂණ වාර්තාවක් ලබා ගැනීම සුදුසුවන නමුත්, එවැනි වාර්තාවක් අනිවාර්යය නොවේ.

කෙසේවෙතත්, පී.සී.ආර් පරීක්ෂණයකට භාජනය නොකර හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගේ සහතිකයකින් තොරව ග්‍රාම සේවක නිලධාරීන් හෝ හදිසි මරණ පරීක්ෂක වරුන් විසින් නිදහස් කරන්නේ නම්, පහත නිර්ණායක සම්පුර්ණ කළ යුතුය;

1. මරණකරු කොවිඩ් ආසාධිත ව නිවසේ ප්‍රතිකාර ලබා ගන්නා පුද්ගලයකු නොවිය යුතුය.
2. මරණකරුගේ ආශ්‍රිතයන් කොවිඩ් ආසාදනය වී හෝ නිරෝධායනය නොවන පුද්ගලයන් විය යුතුය.
3. මරණකරු මියයන අවස්ථාවේ හෝ ඉන් පෙර සති 02ක් තුල හෝ ජීවත් වූ ග්‍රාම නිලධාරී කොට්ඨාශය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා විසින් හුදකලා බවට ප්‍රකාශ කල ප්‍රදේශයක් නොවිය යුතුයි.
4. මරණකරුගේ මරණයට අදාළ බැලු බැල්මට දෘශ්‍යමාන වන හෝ නිශ්චිත හේතුව කොවිඩ් ආසාදනය වීමකට අදාළ නොවිය යුතුයි. එය නිර්ණය කළ හැක්කේ මිය යාමට පෙර උණ, කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව, උගුර කැසීම , ගඳ සුවඳ නොදැනීම, මාංශ පේශි වේදනාව , හිසරදය ආදී ලක්ෂණ වලින් තොර වීම තුලින්ය.

කොවිඩ් 19 වෛරසය ආසාදනය වී ප්‍රතිකාර ලබා රෝහලෙන් පිටව ගොස් මාස 03 ක් තුල නිවසේ දී මිය යන්නේ නම්, එම පුද්ගලයාගේ නැවත පී.සී.ආර් පරීක්ෂණයක් සිදු කිරීම අවශ්‍ය නොවේ. එම පුද්ගලයා කොවිඩ් ආසාදනය වූ බවට සඳහන් කිරීමද අවශ්‍ය නොවේ.එබැවින්, එම මෘත දේහ සාමාන්‍ය ආකාරයෙන් නිදහස් කිරීම සිදු කළ හැකිය.



385,පුවසිරිපාය, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385,வணக்கத்துக்குரியபத்தேகமவிமலவங்சதேரோமாவத்தை,கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

කෙසේ වෙතත් මෙම මරණවල අවසන් කටයුතු පැය 24ක් තුළ සිදුකළ යුතු අතර, මෘත ශරීරය එම්බාම් කිරීම නොකළ යුතුය. එමෙන්ම මෘත දේහය නිවසේ සිට ආදාහනය හෝ භූමිදානය සඳහා ගෙන යා යුතු අතර, අතරමැදි ස්ථානවල (මල්ශාලා වැනි) තබාගැනීම සපුරා තහනම්ය.

එමෙන්ම රෝහල්වලින් මෘත ශරීර නිදහස් කිරීම දිවා කාලයේ මෙන්ම, පහසුකම් ඇති රෝහල්වල රෝහල් බලධාරියාගේ එකඟතාවය මත රාත්‍රී කාලයේදී ද සිදුකළ හැකි බැවින් එම මෘත දේහ රාත්‍රී කාලයේදී ද ඥාතීන් වෙත මුදාහැරීමට කටයුතු කරන මෙන් හදිසි මරණ පරීක්ෂකවරුන් දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිමි.

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්:

1. ගරු සෞඛ්‍ය අමාත්‍යතුමිය - සෞඛ්‍ය අමාත්‍යාංශය
2. ලේකම් - සෞඛ්‍ය අමාත්‍යාංශය
3. ලේකම් - රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය
4. ලේකම් - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
5. පොලිස්පති, පොලිස් මූලස්ථානය
6. රෙජිස්ට්‍රාර් ජනරාල් - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව



385,සුවසිරිපාය, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385,வணக்கத்துக்குரியபத்தேகமவிமலவங்சதேரோமாவத்தை,கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.